# තාර්කික ද්වාර (Logic Gates)

තාර්කික ද්වාරයක් යනු කුමක්ද ?

| |
|---|
| විද්‍යුත් සංඥා (Signals)එකක් හෝ කිහිපයක් ඇතුළත් (Input)කළ විට සම්මත විද්‍යුත් සංඥාවක් පිටතට (Output) ලබා දෙන විද්‍යුත් පරිපථයක් තාර්කික ද්වාරයක් ලෙස හැඳින්වේ. |

තාර්කික ද්වාරයකට විද්‍යුත් සංඥා එකක් හෝ කිහිපයක් ඇතුළත් කළ හැකි අතර එයින් පිටතට ලබා ගත හැක්කේ **(බොහෝ අවස්ථාවලදී)** එක් සංඥාවක් පමණි.

ඔබ විසින් තාර්කික දොරටු පිළිබඳව දැනගත යුතු මූලික කරුණු 3 කි

1. තාර්කික ද්වාරය සඳහා වූ සම්මත රූපය
2. තාර්කික ද්වාරය සඳහා වූ සම්මත සමීකරණය / බූලිය ප්‍රකාශනය
3. තාර්කික ද්වාරය සඳහා වූ සම්මත සත්‍යතා වගුව


මෙහිදී ඔබ විසින් ඉගෙන ගත යුතු තාර්කික ද්වාර ගණන 5 කි.

1. AND තාර්කික ද්වාරය
2. OR තාර්කික ද්වාරය
3. NOT තාර්කික ද්වාරය
4. NAND තාර්කික ද්වාරය
5. NOR තාර්කික ද්වාරය

ඉහත සඳහන් තාර්කික ද්වාර සියල්ල පහත පරිදි කොටස් කළ හැක

| මූලික තාර්කික ද්වාර (Basic Logic Gates) | සංයුක්ත තාර්කික ද්වාර (Combination Logic Gates) |
|---|---|
| 1. AND<br>2. OR<br>3. NOT | 1. NAND<br>2. NOR |

## AND තාර්කික ද්වාරය




මෙම විදුලි පරිපථය දෙස බලන්න. මෙහි **F** ලෙස නම් කර තිබෙන බල්බය දැල්වීම සඳහා **A** හා **B** යන යතුරු ( **Switch**) දෙකම වසා ( **On** ) දැමිය යුතුය. **F** නැමැති බල්බය දැල්වීම සඳහා ඒ වෙත අනිවාර්යයෙන්ම විදුලිය ගමන් කළ යුතුය. මේ සඳහා **A** හා **B** යන යතුරු දෙකම වසා දැමිය යුතුය.

මෙම යතුරුවල ක්‍රියාකාරීත්වය සහ ඒ නිසා බල්බයේ ඇති වන වෙනස පහත වගුවේ සාරාංශගත කරන්න.

| **A යතුර (A Switch)** | **B යතුර (B Switch)** | **F බල්බය (Bulb B)** |
|---|---|---|
| විවෘතයි (**Open**) | විවෘතයි (**Open**) | නොදැල්වේ (**Off**) |
| විවෘතයි (**Open**) | වසා ඇත (**Closed**) | |
| වසා ඇත (**Closed**) | විවෘතයි (**Open**) | |
| වසා ඇත (**Closed**) | වසා ඇත (**Closed**) | |


ඉහත වගුව , වචන වෙනුවට ඉලක්කම් ආදේශ කරමින් ගොඩනඟන්න. මෙහිදී විවෘතයි (**Open**) යන්න " 0 " ලෙසත් වසා ඇත (**Closed**) යන්න " 1" ලෙසත් ආදේශ කරමින් පහත වගුව පුරවන්න.

Hareendra Jayanath Perera
voice 071 4409553 Fax 071 8802612 E-mail hareendra_lk@yahoo.com
web www.hareendraperera.webs.com

| A | B | F |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

**AND** තාර්කික ද්වාරයේ ප්‍රතිදානය “1” වීම සිදු වන්නේ සියළුම ආදානයන් “1” වූ විට පමණක් බව ඉහත වගුව නිරීක්‍ෂණයෙන් පැහැදිලි වනු ඇත.

<u>**AND** තාර්කික ද්වාරය සඳහා වන සම්මත රූපය</u>





ඉහත රූපයේ දැක්වෙන්නේ AND තාර්කික ද්වාරයට අදාළ රූප සටහනයි. මෙහි A හා B යනුවෙන් දැක්වෙන්නේ පරිපථයට ඇතුළු කරනු ලබන විද්‍යුත් සංඥාවන්ය. මෙහි F යනුවෙන් දක්වා ඇත්තේ පරිපථයෙන් පිටතට ලබා දෙන විද්‍යුත් සංඥාවයි.

<u>ඔත්තුවක්</u>

මෙහි ප්‍රතිදානයේ සලකුණ <u>ඇන්ඩ්</u> නොව • වේ

## <u>OR තාර්කික ද්වාරය</u>




මෙම විදුලි පරිපථය දෙස බලන්න. මෙහි **F** ලෙස නම් කර තිබෙන බල්බය දැල්වීම සඳහා **A** හා **B** යන යතුරු ( **Switch**) දෙකෙන් එකක් වසා ( **On** ) දැමීම ප්‍රමාණවත්ය. **F** නැමැති බල්බය දැල්වීම සඳහා ඒ වෙත විදුලිය ගමන් කිරීමට **A** හා **B** යන යතුරු දෙකෙන් එකක් වසා දැමීම ප්‍රමාණවත්ය.

පෙර සිදු කරන ලද ආකාරයටම මෙම යතුරුවල ක්‍රියාකාරීත්වය දැක්වෙන ආකාරයට පහත සඳහන් වගුව පුරවන්න.

| **A යතුර (A Switch)** | **B යතුර (B Switch)** | **F බල්බය (Bulb B)** |
|---|---|---|
| විවෘතයි (**Open**) | විවෘතයි (**Open**) | |
| විවෘතයි (**Open**) | වසා ඇත (**Closed**) | |
| වසා ඇත (**Closed**) | විවෘතයි (**Open**) | |
| වසා ඇත (**Closed**) | වසා ඇත (**Closed**) | |


ඉහත වගුවෙහි වචන වෙනුවට ඉලක්කම් භාවිතා කරමින් පෙර පරිදිම පහත වගුව පුරවන්න.

| A | B | F |
|---|---|---|

Hareendra Jayanath Perera
voice 071 4409553 Fax 071 8802612 E-mail hareendra_lk@yahoo.com
web www.hareendraperera.webs.com

| | | |
|---|---|---|
| | | |
| | | |
| | | |

**OR තාර්කික ද්වාරය සඳහා වන සම්මත රූපය**




ඉහත රූපයේ දැක්වෙන්නේ OR තාර්කික ද්වාරයට අදාළ රූප සටහනයි. මෙහි A හා B යනුවෙන් දැක්වෙන්නේ පරිපථයට ඇතුළු කරනු ලබන විද්‍යුත් සංඥාවන්ය. මෙහි F යනුවෙන් දක්වා ඇත්තේ පරිපථයෙන් පිටතට ලබා දෙන විද්‍යුත් සංඥාවයි.

> ඔත්තුවක්
>
> මෙහි ප්‍රතිදානයේ සලකුණ ඇන්ඩ් නොව + ලකුණ වේ

## NOT තාර්කික ද්වාරය

Hareendra Jayanath Perera
voice 071 4409553 Fax 071 8802612 E-mail hareendra_lk@yahoo.com
web www.hareendraperera.webs.com